# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/68 - 2019 මාර්තු මස 29 වැනි සිකුරාදා - 2019.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*යොමු අංකය: ඩීඑස්එස්/එල්එන්ඩී/03/ඒකිව්යූආර්ඊ/09.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:4-3/6/2010/එච්ඩබ්/244.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සූරියවැව ග්‍රාම නිලධාරි වසමේ හා බැද්දෙවැව ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද අවසානාත්මක භූ ලක්ෂණාත්මක පිඹුරු අංක 04හි අතිරේඛ අංක 243 හා පත්‍ර අංක 591 හා 2016.06.20 දිනැති පිඹුරේ හෙක්ටයාර් 0.0497 ක් වූ කැබලි අංක ඩී 8478 හා ඩී 8481 දක්වා වූ කැබලි 02

01. **කැබලි අංක ඩී 8478**

ඉඩමේ නම: පලුගහහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටස් සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය:- (ජී. කේ. සිරිපාල, සූරියවැව වෙත හ/උව/සූ/අ/8603 දරන අවසර පත්‍රය නිකුත් කර ඇත.1352 වැනි බිම් කැබැල්ලේ කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0471.

02. **කැබලි අංක ඩී 8481**

ඉඩමේ නම: පලුගහහේන;ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය:- (බස්නායක කරුණාදාස, සූරියවැව වෙත හ/උව/සූ/ප්‍ර/342 දරන දීමනා පත්‍රය නිකුත් කර ඇත.1354 වැනි බිම් කැබැල්ලේ කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0026.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019 මැයි මස 13 දින පූ.භා. 10.00ට සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ වියයුතුයි.

තවද 2019.05.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. තවද තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කල යුතුය.

සුභාෂ් නානායක්කාර,
ප්‍රාදේශිය ලේකම්,
සූරියවැව.

2019 මාර්තු මස 15 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සූරියවැව.

04 - 451



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* ඩීඑස්එස්/එල්එන්ඩී/03/ඒකිව්යූආර්ඊ/09.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියට යටත්ව මා විසින් අංක 1984/35 හා 2016.09.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 3ඒ සහ 7ඒ පිටුවල සඳහන් දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බැද්දේවැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු අංක 04, අතිරේක අංකය 243 හා පත්‍ර අංකය 591 හා 2016.06.20 දිනැති පිඹුරේ කැබලි අංක. ඩී 8380 හා ඩී 8477 හි විස්තර පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක ඩී 8380**
ඉඩමේ නම: පලුගහහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 02 ක කොටස් සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඩබ්ලිව්.තිලකපාල, සූරියවැව දීමනා පත්‍ර නිකුත් කර ඇත. ඩබ්ලිව්.ආරියදාස විසින් වගා කර ඇත. 4508 වැනි බිම් කැබැල්ලේ කොටසක්; ප්‍රමාණය: හෙක්. 0.0398.

02. **කැබලි අංක ඩී 8477**
ඉඩමේ නම: පලුගහහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ජී.කේ.සිරිපාල, සූරියවැව වෙත හ/උව/සු/අ/8603 අංක දරන අවසර පත්‍රය නිකුත් කර ඇත. 1352 වැනි බිම් කැබැල්ලේ කොටසක්; ප්‍රමාණය: හෙක්. 0.0013.

සුභාෂ් නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
සූරියවැව.

2019 මාර්තු මස 27 වැනි දින,
සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

04 - 452

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: 3/2/3/10/245 (ii) .

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියට යටත්ව අංක 1817/4 හා 2013.07.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 20 පිටුවේ සඳහන් කැබලි අංක 427 හි ඉඩම් කොටස් දෙකක් පවතින බැවින් එය 2018.06.29 දින ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි ඩබ්ලිව්.එස්.එල්.සී.පෙරේරා මහතා විසින් එම බිම් කොටස 461 හා 462 වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කරන ලදී. එබැවින් එය පහත පරිදි සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 461**
ඉඩමේ නම: වරිපනම් අංක 284, නුවර පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කළගෙඩිහේන නුවර පාර අංක 284 හි පදිංචි ඩබ්ලිව්. පී. ඉරෝෂණී වීරවර්ධන සහ තවත් අය, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0435.

02. **කැබලි අංක 462**
ඉඩමේ නම: වරිපනම් අංක 284, නුවර පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කළගෙඩිහේන නුවර පාර අංක 284 හි පදිංචි ඩබ්ලිව්. පී. ඉරෝෂණී වීරවර්ධන සහ ඩබ්ලිව්. පී. එන්. ඩී. වීරවර්ධන, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0735.

එස්.පී.ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2019 ජනවාරි මස 28 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
අත්තනගල්ල.

04 - 453

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.